00025

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

පෙර පාසල් සහතික පත්‍ර වැඩ සටහන

අවසාන පරීක්ෂණය - 2019/2020

**EPC1533/ESC1233 -** ළමා මනෝ විද්‍යාව

කාලය - පැය තුනයි. (03)

---

දිනය - 2023.06.11 වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ තෝරා ගනු ලබන ප්‍රශ්න තුනකට ද (03) පිළිතුරු සපයන්න.

## පළමු වන කොටස

01. ළමා සංවර්ධනයේ ප්‍රධාන ක්ෂේත්‍ර නම් කරන්න.

02. දරුවන්ගේ අසාමාන්‍ය චර්යා සඳහා හේතුවන සාධක දෙකක් (02) පැහැදිලි කරන්න.

03. "ආත්මකේන්ද්‍රීයභාවය" යන්න උදාහරණයක් ඉදිරිපත් කර පැහැදිලි කරන්න.

04. සිසුන් ප්‍රකට සහ සංවෘත චර්යා ප්‍රදර්ශනය කරන්නේ කෙසේදැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

05. පෙරපාසල් ගුරුවරියකට ළමා මනෝවිද්‍යාව ඉගෙනීමෙන් ඇති ප්‍රයෝජන පහක් (05) ලියන්න.

06. "විශේෂ අවශ්‍යතා සහිත ළමයි" යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

07. ළමයෙකුගේ ජීවිතයේ මුල් අවුරුදු දෙක තුළ දී සංවර්ධනය කරගත හැකි මානසික හැකියා තුනක් (03) සඳහන් කරන්න.

08. සමාග්‍රහණය සහ ප්‍රතියෝජනය යන සංකල්ප හඳුන්වා දෙන්න.

(ලකුණු 05 x 08 = 40)

## දෙවන කොටස

09\. (i) හොඳින් සමාජානුයෝජනය වූ දරුවෙකු වෙතින් දක්නට ලැබෙන ලක්ෂණ පහක් **(05)** ඉදිරිපත් කරන්න. (ලකුණු 10)

(ii) දරුවෙකු සමාජානුයෝගී කිරීම සඳහා පෙර පාසල් ගුරුවරයකුට සංවිධානය කළ හැකි ක්‍රියාකාරකම් තුනක් **(03)** පැහැදිලි කරන්න. (ලකුණු 10)

10\. (i) ළමුන්ගේ පූර්ව ප්‍රසව සංවර්ධනයට බලපාන පරිසරාත්මක සාධක හතරක් **(04)** නම් කරන්න. (ලකුණු 08)

(ii) ඔබ ඉහත සඳහන් කළ සාධක දරුවෙකුගේ පූර්ව ප්‍රසව සංවර්ධනයට බලපාන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 12)

11\. (i) ළමයින් අධ්‍යයනය සඳහා ගුරුවරුන්ට විවිධ පර්යේෂණ ක්‍රම භාවිත කළ හැක. එසේ භාවිත කළහැකි ක්‍රම පහක් **(05)** ලැයිස්තු ගත කරන්න. (ලකුණු 10)

(ii) ඉහත ඔබ සඳහන් කළ එක් ක්‍රමයක් භාවිත කර පෙර පාසල් පන්ති කාමරයේ සිටින දරුවෙක් අධ්‍යයනය කරන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 10)

12\. (i) ආරය සහ පරිසරය යන සංකල්ප දෙක උදාහරණ ඉදිරිපත් කරමින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) දරුවන්ගේ සංවර්ධනයට සුදුසු පරිසරයක් පවත්වා ගැනීමට කටයුතු කළ හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 10)

13\. (i) පෙර පාසල් ළමුන් තුළ ප්‍රදර්ශනය වන පොදු චිත්තවේග රටා පහක් **(05)** නම් කරන්න. (ලකුණු 05)

(ii) උදාහරණ දක්වමින් ඉහත සඳහන් චිත්තවේග රටා දෙකක් **(02)** කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 07)

(iii) පෙර පාසල් ගුරුවරයාට, දරුවාට වාසිදායක වූ චිත්තවේගී පරිසර තත්ත්වයන් නිර්මාණය කළ හැක්කේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 08)

හිමිකම් ඇවිරිණි.